# සෙලෙස්තිනාලා බලන්න කොළඹ ආපු හැටි 2

ජගත් රණතුංග


කැළණි ගඟේ පාරු පාලම

## ඇයි එතැන්ට කයිමන් දොරටුව කීවෙ.?

එතැන තිබුණේ ශාන්ත ජෝන් ඇළ. ඒකෙ කිඹුල්ලු හිටියා. ලන්දේසි බාසාවෙන් කිඹුලන්ට කීවේ කයිමන් කියලා. ඒ නිසයි එතැන කයිමන් දොරටුව වුණේ. අදත් පිටකොටුවේ ග්‍රෑන්පාස් පැත්තට ගියාම අර කයිමන් දොරටුවෙ ඝණ්ඨාරේ හයිකරපු කුලුණ දකින්න පුළුවන්. වීදියක් ශාන්ත ජෝන් නමින් තිබෙන බවත් දකින්න පුළුවනි. ඉස්සර ශාන්ත ජෝන් ඇළත්, බේරෙ වැවත්, වරායත් ඇළමාර්ගවලින් එකට සම්බන්ධ වෙලා තමයි තිබිලා තියෙන්නෙ. අර කයිමන් දොරකඩෙන් තමයි කොටුවත් පිටකොටුවත් වෙන් වෙලා තිබුණෙ. ඒ ඇළ මාර්ග සුදු මහත්තුරුන්ගෙ කාලෙ වහලා තමයි පාරවල් හැදුවේ.

දැන් ඔය පිටකොටුව දිහා තියෙන හරස් පාරවල් සේරම ඒ කාලේ තිබ්බ්ච ඇළ මාර්ග.

ආතාගේ වචන ප්‍රවාහයට තිරිංග නැති සෙයක් පෙනෙයි.



Tram car on York Street Colombo 1900-1910

"ලන්දේසි කාලෙ වෙච්ච දෙයක් මං කියන්නං. මං අර ගෑස්පහ හන්දිය ගැන කිව්වානෙ. ඒ ගෑස්පහ හන්දියේ තමයි මුළු කොළඹටම ගෑස් දුන්න කොම්පැණිය තිබුණෙ. ගෙවල් එළිය වුණොත් වීදි එළිය වුණොත් ගෑස් ලාම්පුවලින්.

මේ එහෙම ගෑස් නැති කාලෙ කතාවක්.

මං කිව්වානෙ අර ඇළමාර්ග ගැන කතාවක්. ඒ ඇළ මාර්ගවලින් තමයි එක එක දිහාවලින් කොළඹට රාජකාරිවලටත් වෙළෙඳාමටත් කට්ටිය ආවෙ. තුන්වෙනි යාමේ පැයට කොළඹ ආවේ පාන්දර කළුවරේ. ඔරු පාරුවලින් තමයි කොළඹ ඇතුළෙ ප්‍රවාහනේ තිබුණෙ. ඔරුවකින් හරි පාරුවකින් හරි යන්න තොටුපළවල් තිබුණා අද තියෙන ඔය බස්නැවතුම් පොළවල් ගාණට. ඔරුවෙ ගිහින් බැස්සාම රේන්දරාළට ගාස්තුවක් ගෙවන්න ඕන. ඒ ගෙවලා ඒ ළඟම තියෙන කඬේට ගිහින් හුළු අත්තක් මිලදී ගන්න වෙනවා. හුළු අත්තක් සත දෙකයි. ඇයි ලැයිට් නෑනෙ. ඒ හුළු අත්ත උස්සගෙන වැඩට ගිහින් නිවා තියාගෙන ආයෙම ඒ හුළු අත්තම ගෙදර අරං යන සිරිතක් තිබුණා. ඇයි ඉතින් හැමදාම සත දෙකේ එව්වා වියපෑදම් කරන්න පුළුවනෑ.

පාරු කතාවෙන් පසු දැන් කොළඹ නගරේ කතාව පටන්ගනී.

"මං අර කිව්වෙ කොළඹ ලැයිට් නැති කාලෙ ගැන නෙ. මේ කියන්නේ ගෑස් ලාම්පු තියෙන කාලෙ. ඒ කාලෙම තමයි කොළඹ ට්‍රෑම් කාර් දිව්වෙ.

එය රසවත් කතාවක් බව මට පැහැදිලිය.

උස් හඬින් කතාකර වෙහෙස වී සිටියදී මා කළේ අතැති කොළේක ආතාගෙන් අහන්නට ඕනෑ දේ ලියා පෙන්වීමය. ආතා කියනවා වාගේ හතේ කැලෑසියෙන් ඉස්කෝලෙ ගමන කඩාකප්පල් වී තිබුණාට පිරිත් සියල්ල කටපාඩමින් කිව හැකිවා වගේම ඕනෑම ජාතක කතාවක් වුවත් මතකෙන් කීමට දක්ෂපක්ෂකම් ඇත්තෙකි. ඒ පමණක් නොව ලියා ඇති ඕනෑම දෙයක් කියවිය හැකිය. දිනපතා ලංකාදීපය ආතාට නැතිවම බැරි වී ඇත්තේද ඒ අනුවය. මගේ ලියවිල්ද ආතාට ගැටලුවක් නැති බව මම කලින්ම දැන සිටියෙමි. මේ පිළිතුරු ලැබෙන්නේ ඒ අනුවය.

"බලන්න එපැයි  අපේ මහත්තයො ඒ කාලෙ කොළඹ ලස්සන. ට්‍රෑම් කාර් දිව්වේ පීලි දෙකක් උඩ. හැබැයි ඊට උඩින් විදුලි කම්බිය. ඒවැයි ගමන් ගියේ සෙලෙස්තිනාලා වගේ ඇත්තො තමයි. බෝරිච්චි හැට්ට ඇඳලා, පටචීත්ත කම්බා දවටාගෙන, මූණෙ පුයරු දාලාහෙම වළලු පිරිච්ච දෑතින් ඒ හැඩකාර නෝනලා දැක්කාම හිත ඇදිලා යනවා ඉබේම.

තරුණ අවධියේ කාටත් දැනෙන හැඟීම් වියෝලිස් ආතාට දැනෙන්නට වීම අරුමයක් නොවේ.

"ට්‍රෑම් කාර් තමයි ඉස්සර කොළඹ හතර වටේට දිව්ව ජනප්‍රියම වාහනේ. දකුණු ආසියාවෙම්ම මුල්ම වතාවට ට්‍රෑම්කාර්


කොළඹ එදා

දිව්වේ අපේ රටේ. ඒකෙ මංගල ගමන ගිහින් තියෙන්නෙ ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලේ ළඟ ඉඳලා තොටළඟ දක්වාය. ගමනට ගතවී ඇත්තේ පැය කාලකි. ඔය ට්‍රෑම් කාර් එන්න කලින් කොළඹ තිබුණේ රික්ෂෝ කරත්තයි. ඒවා ඇදගෙන ගියේ දාඩිය මුගුරු පෙරාගෙන මිනිස්සු. කාලයක් යනකොටනෙ ට්‍රෑම් කාර් ආවෙ. අන්න එතකොට අර අයට රික්ෂෝ රස්සා නැති වුණා. ඉතිං ඒ අය නිකං හිටියෙ නෑ. නොයෙකුත් උද්ඝෝෂණ කළා. පෙළපාළිත් ගියා. ඒ මදිවාට හැංගිලා ඉඳන් ට්‍රෑම් කාර්වලට ගල්මුල් ගැහුවා. ඒ සැරේ ට්‍රෑම් කාර්වලින් මිනිස්සු ගමන් බිමන් යෑම නැවැත්තුවා.

මේ අර්බුදය සල්ලි වියදම් කරලා, ට්‍රෑම් කාර් කොම්පැනියත් එක්කත් රික්ෂෝකාරයන් එක්කත් ඉංගිරිසි ආණ්ඩුව සාකච්ඡා කරලා විසඳා ගත්තා. අර හැංගිලා ගල්ගහපු අය අල්ලාගෙන  ඒ උදවියට දඬුවමුත් දුන්නා. ඊට පස්සේ ආයෙත් කරදරයක් නැතිව ට්‍රෑම්කාර් දුවන්න ගත්තා. ට්‍රෑම් කාර් කොළඹ දුවන්න පටන් ගත්තා වුණාට ඒ අයට ගෙවන ගෙවීම් මදිය කියලා වර්ජනයක් පටන් ගත්තා එකදාස් නමසිය හතළිස් හතර අවුරුද්දෙ. ඒ අරගලයේ සාර්ථක ප්‍රතිඵල රියැදුරන්ට ලැබුණා. නමුත් ඒ ටික කාලයයි. ට්‍රෑම් කාර් වෙනුවට අලුත් බස් ජාතියක් ආවා. ඒවාට කිවුවේ ට්‍රොලි බස් කියලා. මට හරියටම දිනේ මතක නෑ. නමුත් ඒ එකදාස් නමසිය පනහෙ. ඉස්සර ජනගහනයත් අඩුයිනෙ. ඒ හන්දා ප්‍රශ්නත් අඩුයි. ඒ වගේම වටපිටාවත් ලස්සනයිනෙ. හැබැයි ඇතිවුණු දියුණුවේ තරම ගැන පුදුමත් හිතෙනවා.

වියෝලිස් ආතාගේ දේශපාලනය ගැනත් ටිකක් කථා කළ යුතුය.

"මම මුල ඉඳම්ම හොඳ සමසමාජකාරයෙක්. මගේ ප්‍රියතම දේශපාලනඥයා ඇන්.ඇම්. පෙරේරා. මං ඒ කාලෙ එක ඡන්ද රැස්වීමක්වත් වරද්දන්නෙ නැතිවා වාගේම ඒ කාලෙ වමේ පෙළපාළිවලටත් නොවරදවාම යනවා.

සමසමාජකාරයකු යැයි කියන මේ වියෝලිස් ආතා යක්ෂයන් හා පෙරේතයන් සමග වැඩ කිරීමද, තොවිල්පවිල් ආදිය කිරීමද යන කාරණා මට ඉතිරි වුණු සංයුක්ත අභූත ප්‍රශ්නයකි. එසේම යමක් සිතාගන්නටද පෑදුණු මගකි.

එනම් විද්‍යාත්මක සමාජවාදය යැයි කියන්නේ කුමකටද යන්නයි. ඔවුහු තොවිල් පවිල් කරත්ද?